# පණුවා

# සහ

# ඇපල් ගෙඩිය



උදේශි පවනි යාපා බණ්ඩාර

චිත්‍ර : උදේශි පවනි යාපා බණ්ඩාර

**ප්‍රථම මුද්‍රණය. : 2025/02/08**

ISBN :978-624-208-608-8

කර්තෘගේ වෙනත් කෘති : මගේ පුංචි බලු රාළ

: දළඹු පැංචා සමනළයෙක් වුන හැටි

: කුරුලු පවුල

පිදුම

මා හට ශක්තියක් වූ

අම්මාටත් තාත්තාටත්

මෙම පොත ලිවීමට මාව උනන්දු කරපු ආදරණීය අමිතා කුමාරි ගුරුතුමියටත්

මෙම පොත් පිංච උපහාරයක් ම

වේවා.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි..ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුගකැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය.

එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි.

පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අපගේ ගත් කතුවරයන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන්ඔබ්බටයමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ  කරදන අත්ථදස්සි මාහිමිපාණන්  වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන හෙළ ගත්කරණි ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතේ මුල් අවදියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘති ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය  සඳහාද අත්වැලක් වන නො අනුමානය.

විදුහල්පතිනිය,

ශෂිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

ඔන්න එකෝමත් එක කාලෙක හොඳම හොඳ යහළුවෝ දෙදෙනෙක් සිටියා. එක යහළුවෙක්ගේ නම පෙරී. අනෙක් යාළුවාගේ නම මීනා.



මේ දෙන්නා දවසක් කැලෑවේ ඇවිදින්න ගියා. ඔන්න කැලෑවේ මැදින් යද්දි හම්බවුණා ලොකු ම ලොකු උසට හැදිලා තිබුණ ඇපල් ගහක්. ඒ ඇපල් ගහ දැක්ක ජෙරී කිව්වා,

“මීනා අර බලන්න ඇපල් ගහ දිහා. ඔයාට ඇපල් කඩන්න පුළුවන් ද ?”



මීනා නැමිලා තිබුණ අත්තෙන් ඇපල් ගෙඩි කඩන්න බැලුවා. ඒත් බැරිවුණා. ඊට පස්සේ ඒ දෙන්නා චුට්ටක් කල්පනා කරලා බැලුවා මොකක්ද කරන්න පුළුවන් කියලා.

"ඔන්න ජෙරී මට අදහසක් ආවා. අපි ගස සොලවමු. එතකොට ඇපල් ගෙඩි ගොඩාක් වැටෙයි.

එතකොට අපි දෙන්නටම ඇති වෙනකම් කන්න පුළුවන්."



දෙන්නම එකතු වෙලා ගස හොලව්වා. දැන් හොඳටෝ ම මහන්සි. ඇපල් ගහ ළඟ ඉඳගෙන දෙන්නම ඇපල් ගෙඩි කන්න පටන් ගත්තා.



ඔන්න එක ඇපල් ගෙඩියක සිදුරක් තිබුණා. මීනා හිතුවේ නෑ මේ සිදුර ඇතුළේ කවුරු හරි ඉන්නවා කියලා. ඉතින් මෙයා ඇපල් ගෙඩිය කටට ගන්නකොටම සෙවල ගතියක් දැනුණා. එතකොට පුංචි ම පුංචි පණු පැටියෙක් එළියට ආවා.



“අනේ මාව කන්න එපා, කන්න එපා”  කියලා පුංචි පණු පැටියා කෑ ගැසුවා. ඉතින් මීනා ජෙරී ට කතා කරා.

“ජෙරී එන්න එන්න මේ බලන්න පණු පැටියා කතා කරනවා.”

“ඇත්තට කෝ..  මේ ඉන්නේ මගේ ඇපල් ගෙඩියේ.”

මීනා කීවා.  පණු පැටියෝ ඔයා කොහොමද ඇපල් ගෙඩිය ඇතුලට ආවේ.

පුංචි පණු පැටියා මෙන්න මෙහෙම කිව්වා .

“මම ඇපල් ගෙඩිය දැක්කට පස්සේ මගේ කටේ කෙළ පිරුණා. මම ඇපල් ගෙඩිය ඇතුලට යනකම් කෑවා. ඊට පස්සේ මගේ බඩ පිරුණා. ඇපල් ගෙඩිය පැණි ම පැණි රහයි. ඔයාලත් ඕනෙනම් කන්න. ඒ තරම් රහයි.”

“එහෙම ද?”



“අපි කාලා බලන්නම්කෝ… ම්… ඒක නම් කිව්වා වගේම රහයි.”

“කොහොම ද ඔයා මෙච්චර පැණි බේරෙන ඇපල් ගෙඩියක් හොයාගත්තේ?”

“මට ලොකු බඩගින්නක් ආවා. ඒක නිසා මම මොනවා හරි කන්න ඇවිදගෙන ආවා. එතකොට මම දැක්කා ලොකු ඇපල් ගෙඩියක්. ඉතින් මට ඇපල් ගෙඩිය කන්න ඕන කියලා හිතුණා. ඒක කනකොට එකපාරට ම හැම දෙයක් ම අඳුරු වෙන්න ගත්තා. ඉතින් මම මොකක් ද කියලා බලන්න එළියට ආවා. එතකොට මාව ඔයා කන්න හදනවා. ඒ හින්දා තමා මම කෑ ගැහුවේ.”



“අනේ සමාවෙන්න පණූ පැටියෝ. මම දන්නේ නෑ ඔයා මේක ඇතුළේ ඉන්නවා කියලා.”

“හරි හරි ඉතින් ඔයා හිතලා නෙවේනේ කරේ. මම සමාව දෙන්නම්.”

“ඔයාට ස්තූතිවන්ත වෙනවා.”

“හරි හරි දැන් ඉතින් තුන්දෙනා ම යාළුවෙමු.”

ඔන්න එදායින් පස්සේ තුන්දෙනා ම හොඳ ම හොඳ යහළුවෝ වුණා..

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.

එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි..

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදිශිෂ්‍යාවන් දැක් වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය..

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබාදිය නොහැකිය.මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි..

මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘතිය රචනා කරයි.

තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනවිරත්න මහලේකම්.